අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

**උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව**

**12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2025 (දෙවැනි අදියර)**

2024 (2025) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල නිකුත් වීමත් සමඟ, 2025/2026 අධ්‍යයන වර්ෂයේ ම දෙවැනි අදියර ලෙස උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ 12 ශ්‍රේණියට නවක සිසුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විෂය ධාරාවට සිසුන් ඇතුළත්කර ගැනීමේ දී **අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵලය සලකා බලනු නොලැබේ.**

වෘත්තීය විෂය ධාරාව යටතේ, **12 ශ්‍රේණියේ පාසල් අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර**, **13 ශ්‍රේණියේ දී** පහත දක්වා ඇති වෘත්තීය විෂයයන්ගෙන් එකක් යටතේ ඇති ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ **වෘත්තීය පුහුණු පාඨමාලාවක්** සඳහා සිසුන් යොමු කෙරේ. පාඨමාලා සාර්ථක ව සම්පූර්ණ කරන සිසුන්ට **NVQ4 සහතිකය** ලබා ගැනීමට හැකි වේ.

1. ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය
2. සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය
3. ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා
4. ප්‍රාසාංගික කලාව
5. කාර්ය සිද්ධි කළමනාකරණය
6. ශිල්ප කලා
7. අභ්‍යන්තර නිර්මාණකරණය
8. විලාසිතා නිර්මාණකරණය
9. ග්‍රැෆික් නිර්මාණකරණය
10. සංචරණය හා ආගන්තුක සත්කාර
11. භූ දර්ශන නිර්මාණකරණය
12. ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය
13. පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
14. ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
15. ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය
16. වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
17. ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය
18. මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය
19. විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය
20. පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය
21. ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය
22. ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය
23. කලාව හා පිරිසැකසුම්කරණය
24. පාරිසරික අධ්‍යයනය
25. පරිගණක දෘඩාංග සහ ජාලකරණය
26. නිමැවුම්කරණය
27. විකුණුම් හා අලෙවිකරණය
28. සැපයුම් කළමනාකරණය

මේ අනුව, උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව හැදෑරීමට අපේක්ෂා කරන සිසුන්, මේ සමග ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පතක් **2025.08.14** දින වන විට ඉල්ලුම් කරන පාසලේ විදුහල්පතිට යොමු කළ යුතු ය. (විෂය ධාරාව ක්‍රියාත්මක කෙරෙන පාසල් ලේඛන මෙතැනින් ලබා ගන්න)

වැඩිදුර තොරතුරු සඳහා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා දුරකථන අංක 0112 787136/ 0112 786746 ඇමතිය හැක.

**බී. ඩී. එස්. බාලසූරිය**
**අධ්‍යාපන අධ්‍යක්ෂ (සැමට අධ්‍යාපන ශාඛාව)**

tamilguru.lk